## 1.14 පශ්චාත්නූතනත්වය යනු නූතනත්වයේ වත්මන් අවධිය වෙයි

නලින් ද සිල්වා
ගණිතය අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

---

### ABSTRACT

ඇතැමුන්ට අනුව දැන් පවතින්නේ පශ්චාත්නූතනත්වයකි. ඔවුන් විසින් සඳහන් කරනු ලබන්නේ නූතනත්ව යුගය පසුකර අප දැන් පශ්චාත්නූතන යුගයකට පිවිස ඇති බව ය. මේ සම්බන්ධයෙන් ඇතැම් මතිමතාන්තර ඉදිරිපත් වී ඇති අතර ඒ පශ්චාත්නූතනවාදයට අයත් වෙයි. පශ්චාත්නූතනත්වය හා පශ්චාත්නූතනවාදය යනු එකක් නොව දෙකකි. එහෙත් ඒ අන්‍යොන්‍ය වශයෙන් බහිෂ්කාර නොවන බව ද සඳහන් කළ යුතු ය.

පශ්චාත්නූතනත්වයක් වේ නම් ඒ හඳුනාගන්නේ කෙසේද? වෙනත් වචනවලින් කිවහොත් නූතනත්වය අවසන් වී (ලෝකයේ සියලු තැන එක්විට අවසන් වී යන අරුතක් නොමැති බව පැහැදිලි විය යුතුය.) පශ්චාත්නූතනත්වය ඇරඹෙන්නේ කෙසේද? පශ්චාත්නූතනත්වය හඳුනාගැනීමට ඇති නිර්ණායක කවරේද?

ලියෝතාද් විසින් ලියන ලද පශ්චාත්නූතන අවශ්‍යතාව (Postmodern Condition) මෙහිදී යොදාගත හැකි හොඳම කෘතිය වෙයි. එහි ඇත්තේ ඔහුට අනුව පශ්චාත්නූතනත්වය හැඳිනගැනීමට අවශ්‍ය නිර්ණායක කිහිපයකි. මේ නිර්ණායක නූතනත්වයේ නොමැති බවත් ඒ අයත්වන්නේ පශ්චාත්නූතනත්වයට බවත් ලියෝතාද්ගේ අදහස බව පැහැදිලි ය.

අප මේ අධ්‍යයනයෙන් පෙන්නුම් කරන්නේ ඒ නිර්ණායක ආධාරයෙන් නූතනත්වය ඊනියා පශ්චාත්නූතනත්වයකින් වෙන්කිරීමට නොහැකි බව ය. පහළොස්වැනි සියවසේ ඇරඹි නූතනත්වය ඉන් පෙර තිබූ යුරෝපීය මධ්‍යකාලීන වැඩවසම් ක්‍රමයෙන් වෙන් කළ හැකිය. ඒ බව වැඩවසම් සංස්කෘතිය හා එකල තිබූ කතෝලික චින්තනය පසුව ඇති වූ නූතනත්ව හෙවත් බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය හා ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය අතර වූ වෙනස්කම්වලින් පැහැදිලි වෙයි.

නූතනත්වයේ න්‍යාය (logic), ආකල්ප, දර්ශනය, ආදිය ඊනියා පශ්චාත්නූතනත්වයේ එවැනි දෙයින් වෙනස් නො වෙයි. ලියෝතාද් දක්වන පශ්චාත්නූතන අවශ්‍යතා නූතනත්වයේ ම අවශ්‍යතා වෙයි. එහි මූලික වෙනසක් සිදු වී නැතී ආලෝකනය (enlightenment) ආදි විවිධ යුග ඔස්සේ නූතනත්වය විකාශය වී ඇත. ආලෝකනය නූතනත්වයේ එක් අවධියක් වන්නාක් සේ ම ඊනියා පශ්චාත්නූතනත්වය ද නූතනත්වයේ වත්මන් අවධිය බව මෙම අධ්‍යයනයෙන් පෙන්නුම් කෙරෙයි.